'සියල්ලන්ටම ඉංග්‍රීසි' වැඩසටහන යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපදේශකත්වය සපයන ඉංග්‍රීසි ගුරුවරුන් 2500ක් බඳවා ගැනීමට කැබිනට් අනුමැතිය හිමිව තිබේ.

රජයට අනුව සාමාන්‍ය පෙළ විෂයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව 4441ක් වුවද ගුරුවරුන් 6500ක අවශ්‍යතාවක් පවතී.

පාසල් 765ක් සමඟ කරන ලද අධ්‍යයනයකට අනුව බොහෝ පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමේ කටයුතු දීර්ඝ කර ඇති බව රජය පවසයි.

ඒ අනුව ඉංග්‍රීසි මාධ්‍ය විෂයන් උගන්වන අනුමත ගුරුවරුන් සංඛ්‍යාව වැඩි කිරීමට ජනාධිපතිවරයා සහ අධ්‍යාපන අමාත්‍යවරයා එක්ව ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

දැනට ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් උගන්වන පාසල් 765ට අදාළව 2024 වසර තුළ ගුරු අවශ්‍යතාව 1000කින් සපුරාලීම සඳහා ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් උගන්වන ගුරුවරුන් සංඛ්‍යාව 6500 දක්වා වැඩි කිරීමටත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන ගුරුවරුන් 2500ක් බඳවා ගැනීමටත් නියමිතය.

10. **"සැමට ඉංග්‍රීසි" වැඩසටහන යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සිදු කරන ගුරුවරු 2,500ක් බඳවාගැනීම**

ඉංග්‍රීසි මාධ්‍යයෙන් සාමාන්‍ය පෙළ විෂයයන් ඉගැන්වීම සඳහා දැනට අනුමත ගුරුවරුන් සංඛ්‍යාව 4,441ක් වුවත්, ඒ සඳහා ගුරුවරුන් 6,500ක පමණ අවශ්‍යතාවක් පවතින බවත්, බොහෝ පාසල්වල දැනට සේවයේ නියුතු ගුරුවරු සංඛ්‍යාවට අතිරේකව අවශ්‍ය කටයුතු සැලසුම් කරගනිමින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම පුළුල් කර ඇති බවත් පාසල් 765ක් සම්බන්ධයෙන් සිදු කරන ලද ඇගයීමකදී හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, දැනට ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් ඉගැන්වීම සිදු කරනු ලබන පාසල් 765ක ප්‍රමාණය 2024 වර්ෂය තුළදී පාසල් 1,000ක් දක්වා වැඩි කරමින් ගුරු අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් උගන්වනු ලබන අනුමත ගුරුවරු සංඛ්‍යාව 6,500 දක්වා වැඩි කිරීමටත්, ඒ සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් උගන්වනු ලබන ගුරුවරුන් 2,500ක් බඳවා ගැනීමටත් ගරු ජනාධිපතිතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.